# දේශජ විසඳුමක්

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයට එකඟ ව හෝ වෙනත් අයුරකින් හෝ බලය බෙදීම අතාර්කික ය. ඒ බව අපි කලින් සාකච්ඡා කෙළෙමු. එමෙන් ම වෙනත් සංදර්භයක අත්සන් කරන ලද ඉන්දු ලංකා ගිවිසුම වර්තමානයෙහි වලංගු නො වේ. ඒ අහෝසිකිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ඉන්දියාව සමග සාකච්ඡා ඇරඹිය යුතු ය. දහතුන ධන යනුවෙන් කියැවෙන දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉක්මවා යන බලය බෙදීමක් ගැන කතාකිරීමට තරම්වත් දෙයක් නැත. හැරත් බොහෝ දෙනාට අමතක වුව ද දහතුන ධන කලින් ප්‍රතික්ෂේප වී ඇත. චන්ද්‍රිකා කුමාරතුංග විසින් පැකේජය නමින් ඉදිරිපත්කරනු ලැබුයේ දහතුන ධන ගණයේ බලය බෙදීමකි. එයට සිංහල ජනතාවගේ බහුතරය විරුද්ධ වූ බැවින් චන්ද්‍රිකාට ඒ හකුළාගැනීමට සිදුවිය. එදා මහින්ද රාජපක්ෂ මහතා පැකේජයට විරුද්ධ ස්ථාවරයක් ගත්තේ චන්ද්‍රිකා කුමාරතුංගට වඩා ඒ මහතා ශ්‍රී ල නි පක්ෂය යනු කුමක්දැයි දැන සිටි බැවිනි. චන්ද්‍රිකා කුමාරතුංගට අවශ්‍ය වුයේ ශ්‍රී ල නි ප ජාතිකත්වයේ මාර්ගයෙන් පීලිපන්නා මහජන පක්ෂ මතයට ගැනීමට ය. මංගල සමරවීරට ශ්‍රී ල නි පක්ෂයෙන් යෑමට සිදුවුයේ ඔහු කුමාරතුංග ප්‍රතිපත්තියේ ආරක්ෂකයා වූ බැවිනි. ඔහුට පමණක් නොව චන්ද්‍රිකාට ද දේශපාලන වශයෙන් සියදිවි නසාගැනීමට සිදුවුයේ දහතුන ධන ක්‍රියාත්මක කිරීමට ගොස් ය.

දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම අසාධාරණයක් සිදු වී නොමැති බව අප පෙන්වා දී ඇත. දෙමළ ජනයා කොන්වීම ද අසත්‍යයක් බව අපි කීවෙමු. දෙමළ ජනතාවට හා භාෂාවට වැඩිම වැදගත්කමක් ලැබෙන්නේ ලංකාවේ බව අපි නැවත නැවතත් කියමු. වෙල්වනායගම් කුඩා කල හැදුණු වැඩුණු මලයාවේ (මලයාසියාවේ) ඉන්දියන් (මූලික වශයෙන් දෙමළ) ජනතාවට ඇති ප්‍රශ්න ගැන පසුගියදා සාකච්ඡා කර තිබුණි. අපට බොහෝ විට පරමාදර්ශී රටක් ලෙස ඉදිරිපත් කෙරෙන කැනඩාවේ ඉංගිරිසි කතාකරන්නන් වැඩි වශයෙන් වාසය කරන නගරවල ප්‍රංශ භාෂාව දැකගත හැක්කේ අධිවේගී මාර්ගවල ප්‍රංශ බසින් පිටවීම යනුවෙන් සඳහන් කර ඇති පුවරුවල පමණ ය. එහෙත් කැනඩාවේ ඇතැම් ඉංගිරිසි කතාකරන මන්ත්‍රීවරු දෙමළ ජනයාට සැළකීම පිළිබඳව අපට ඉංගිරිසියෙන් බයිලා කියති. ඉංගිරිසින්ගේ අනුග්‍රහයෙන් මෙරට දේශපාලනයේ නායකයන් වීමට, වෘත්තීන්හි හා රැකියාවල දෙමළ ජන අනුපාතය මෙන් තුන් හතර ගුණයක නියෝජනයක් ලබාගැනීමට හැකි වූ ඉංගිරිසි කතාකරන යාපන වෙල්ලාලයෝ ඒ වරප්‍රසාද ක්‍රමයෙන් තමන්ට අහිමිවන කල ඒ අසාධාරණ ලෙස අර්ථනිරූපණය කරමින් පසුව ඉංගිරිසි කතානොකරන හා යාපන වෙල්ලාල නොවන දෙමළ ජනයා ද අසත්‍ය ප්‍රචාර මගින් තම විරෝධතාවලට එක්කරගනිමින් මහත් විනාශයක් කළහ. ඔවුන්ට ජාතිය යනු කුමක්දැයි තේරුම්ගැනීමට නොහැකි කසිකබල් මාක්ස්වාදීහු ද ඇතැම් සිංහල ක්‍රිස්තියානි හා කතෝලික ප්‍රභූහු ද ආධාර කළහ. දැනුදු ආධාර කරති. එහෙත් සාමාන්‍ය සිංහල ක්‍රිස්තියානීන්ගේ හා කතෝලිකයන්ගේ බහුතරය මේ සිංහල බෞද්ධ විරෝධීන් හඳුනාගෙන තිබීම සතුටට කරුණකි.

කෙසේ වෙතත් ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා ගෙනෙනු ලැබූ කෘෂිකාර්මික කම්කරුවන් වූ වෙල්ලාලයන් හා පසුව ඉංගිරිසින් විසින් නැගෙනහිර වෙරළේ බිම් තීරුවක පදංචි කරනු ලැබූ දෙමළ ජනයා සිංහල ජාතිය පළල් කර එයට එක්කරගැනීමේ ප්‍රශ්නය අද දවසේ අපට ඇත. මෙහි දී අප ඉදිරිපත්කරන විසඳුම කොටස් දෙකකින් සමන්විත වෙයි. ඒ දෙකම අපේ ඉතිහාසයෙන් ලබාගත් අත්දැකීම් මත පදනම් වෙයි. අපේ විසඳුම පඬුඅබා විසඳුමක් වෙයි. විස්තරාත්මක ව කියන්නේ නම් පඬුඅබා කළ දේ අදට ගැලපෙන පරිදි සකස්කිරීමක් එහි දී සිදුවෙයි. පඬුඅබා එකල සිටි ගෝත්‍ර හා වංශ රාශියක් එක්කර සිංහල ජාතිය ගොඩනැගී ය. එයට වැදි ජනයා විරුද්ධ වී ඇති බව පැහැදිලි ය. එමෙන් ම යක්ෂ ගෝත්‍රයේ ද ඇතැමුන් මුල දී සිංහල ජාතිය බවට පත්වීම ප්‍රතික්ෂේප කර ඇත. එහෙත් කාලයාගේ ඇවෑමෙන් යක්ෂයන් ද සිංහල ජාතියට එක් වී ඇත. පඬුඅබාට සහාය දුන් යක්ෂ ගෝත්‍රිකයන් අතර චිත්‍රරාජ, කාලදේව වාලමුබී ආදීන් සිටි බව පැහැදිලි ය. පඬුඅබා චිත්‍රරාජට සම අසුන් දෙන්නට ඇත්තේ ඊනියා පීතෘත්වයක් නිසා නොව යක්ෂ ගෝත්‍රිකයන් තව තවත් සිංහල ජාතියට එක්කරගැනීමේ අභිලාෂයෙන් යැයි සිතමි. අද අපට පඬුඅබා විසඳුම එලෙසින් ම ක්‍රියාත්මකකිරීමට නො හැකි ය. දෙමළ ජනයාගෙන් තම අනන්‍යතාව සිංහල ජාතියෙහි දියකර හරින ලෙස ඉල්ලීමට නො හැකි ය. ඔවුන් දිගට ම දෙමළ භාෂාව යොදාගනු ඇත. එමෙන් ම හින්දු සංස්කෘතිය හා ආගම ද රැක ගැනීමට ඔවුන් කටයුතු කරනු ඇත. ඒ කිසිවක් සිංහලයන්ට ප්‍රශ්න විය නො හැකි ය. සිංහල ජාතිය පළල්කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ දෙමළ හින්දු අනන්‍යතාව නැතිකිරීම නො වේ. ඉන් අදහස්වන්නේ මෙරට සියළු ජනයා තමන් එක් ජාතියකට අයත් ය යන සිහිය (සතිය) ඇතිකර ගැනීමත් ඒ ජාතියෙහි විශේෂිත සංස්කෘතියක් ඇති බවත් ඒ සිංහල බෞද්ධ සංස්කෘතිය බවත් පිළිගැනීමත් ය. එමෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂිත බව ව්‍යවස්ථාවට

© Prof. Nalin De Silva

ඇතුල්විය යුතු යැයි අපි අවධාරණය කරමු. මෙරට ප්‍රශ්නය දෙමළ ජාතියට වූ අසාධාරණයක් නොව සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම ය. ඒ නිවැරදි කළ යුතු ය.

බටහිර රටවල් තම ව්‍යවස්ථාවල තමන් අනාගමික, ඓහික රාජ්‍ය ලෙස හඳුන්වනවා ඇත. එහෙත් ඒ පට්ටපල් බොරුවකි. ඔවුන්ට ව්‍යවස්ථාවල බොරු කිමට හැකි ය. ඉන්දියාවට ද හැකි ය. ඒ සියළු රටවල ව්‍යවස්ථාවල කුමක් තිබුණත් අධිපතිවාදී සංස්කෘති වේ. බටහිර රටවල විවිධ වර්ගවල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘති වෙයි. ඉන්දියාව කුමක් කීවත් එහි අධිපතිවාදී සංස්කෘතිය හින්දු වෙයි. සික් ජනවාර්ගිකයකු අගමැති වීමෙන් ඒ බව වෙනස් නො වේ. ඉන්දියාවේ හින්දී භාෂාවට ඇති තැන වෙනත් කිසිම භාෂාවකට නැත. සිංහල බෞද්ධයෙන්ට තම සංස්කෘතිය අධිපතිවාදී සංස්කෘතියක් බවට පත්කිරීමට අවශ්‍ය නැත. ඒ සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ම ගලා එන්නකි. සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට විශේෂිත සංස්කෘතිය වීම ඉතිහාසයෙන් කියැවෙන්නකි. මෙරට නායක්කාර වාංශිකයන් රජවීමේ දී ඔවුහු සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂත්වය පිළිගත්හ. එපමණක් නො වේ. බ්‍රවුන්රිග් සිංහල නායකයන් සමග සිංහල ඉංගිරිසි ගිවිසුම හෙවත් ඊනියා උඩරට ගිවිසුම අත්සන් කිරීමේ දී සිංහල නීතිය අනුව රට කරවීමටත් බුදුසමය රැකීමටත් පොරොන්දු විය. ඉංගිරිසින් පසුව ගිවිසුම කැඩූ නමුත් ඔවුහු මුල දී ගිවිසුම මගින් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂත්වය පිළිගත්තෝ ය. අප ව්‍යවස්ථාවෙහි සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය බව සඳහන්විය යුතු යැයි කියන්නේ එසේ නොකළහොත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය යටතේ වර්තමාන බ්‍රවුන්රිග්ලා කෙසේ ක්‍රියාකරන්නේ ද යන්න අප දන්නා බැවිනි. සිංහල බෞද්ධයන් තරම් අන්‍ය සංස්කෘතීන් රැකි පිරිසක් නැත. අදත් එසේ ම ය. ප්‍රංශය ඇතුළු බටහිර රටවල මුස්ලිම් කාන්තාවන්ට පර්දාව ඇඳීම තහනම් කරන්නේ ප්‍රංශ විප්ලවයේ සමානතාව යන්න හා ඊනියා බහුසංස්කෘතික රටක් යන්න ව්‍යාජයක්, ප්‍රලාපයක් බවට පත්කරමිනි. බහුසංස්කෘතික යන්නෙන් බොරුවට සියළු සංස්කෘතීන් සමාන යැයි කීම අපි ප්‍රතික්ෂේප කරමු. අන් රටවල අධිපතිවාදී සංස්කෘතීන් තිබියදීත් අප ඉල්ලා සිටින්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය බවට පිළිගන්නා ලෙස ය. මෙරට ඊනියා බහුසංස්කෘතික නියෝජිතයන් බහුසංස්කෘතිය ගැන කියවන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි ආධිපත්‍යය ඉදිරියේ දණ නමමින් ය. දෙමළ හා අනෙක් ජනවර්ග සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය බව ව්‍යවස්ථාවෙන් නොපිළිගන්නේ නම් අපට පෙනෙන තෙක් මානයක සාමයක් නැති බව එකහෙළා කිව යුතු ය. අනෙක් අතට සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය ලෙස පිළිගෙන ඒ රැකීමට හා පෝෂණය කිරීමට ප්‍රතිඥාදෙන අසිංහලයකු වුව ද අනාගතයේ දී ජනාධිපති ධුරයට පත්කරගැනීමට අපට හැකි විය යුතු ය.

අපේ විසඳුමෙහි දෙවැනි කොටස පරිපාලනය විමධ්‍යගත කළ යුතු ය යන්න ය. එයින් අදහස්කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගමක් ගමක් පාසා බිහිකිරීම නො වේ. ඉංගිරිසින්ගෙන් අපට ලැබුණු පරිපාලන රටාව ක්‍රමයෙන් ඉවත්කිරීමට අප කටයුතු කළ යුතු ය. ව්‍යවස්ථාදායක බලය බෙදා නොහැර රාජසභාවට පමණක් ඒ පැවරීම අපේ සම්ප්‍රදාය ය. අපේ යුවරජවරු රජු වෙනුවෙන් රට කරවූහ. පළාත් සභාවල බලතල හා ව්‍යුහය වෙනස්කර මහඇමතිවැන්ට හා පළාත්සභාවලට ව්‍යවස්ථාදායකය හා විධායකය වෙනුවෙන් රටකරවීමේ බලය ලබාදිය හැකි ය. ඒ එක්සේසත් රාජ්‍යයක රටාවට අනුකූලව ය. පරිපාලනය ගම්සභාවලටත් වඩා කුඩා සභාවලට පැවරිය හැකි ය. එහි දී උදාහරණයට ගතයුත්තේ පැරණි තොවිල්පහ වැනි සභා ය. එහි අරමුණ වත්මන් බසින් කියන්නේ නම් සෘජු ප්‍රජාතන්ත්‍රවාදය හා ස්වයංපරිපාලනය ඇති කිරීම ය. ගමේ කෘෂිකර්ම නිලධාරීන් විය යුත්තේ අත්දැකිම් ලත් ගොවි මහතුන් මිස බ්‍රිතානීන් පිහිටු වූ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාට අවසානයේ දී වගකියන ඊනියා ක්ෂේත්‍ර හෝ කාර්යාලයීය හෝ නිලධාරියකු නො වේ. පන්සලේ හාමුදුරුවන් මේ සියළු සභාවල අනුශාසක තනතුර හෙබවිය යුතු ය.

මෙරට සංස්කෘතිය විසින් ජනතාව පුරුදු කෙරී ඇත්තේ උඩින් එන අණට අනුව වැඩකිරීමට නොව තම තමන් එකතු වී වැඩකිරීමට ය. අප අපේ වැඩ යැයි කියන්නේ අප සංවිධානය කරන වැඩවලට මිස ආණ්ඩුවේ වැඩට නො වේ. ඊනියා ජනසතු සේවා රජසතු සේවා පමණක් බව අප පිළිගත යුතු ය. ජනසතු සේවා මධ්‍යගත විශාල සංවිධාන වියහැකි නො වේ. බ්‍රිතානි මධ්‍යගත පරිපාලනය බොහෝ විට මෙරට අසාර්ථක වී ඇත. සුනාමියේ දී මෙරට ජනතාව තම තමන් සංවිධානය වී වැඩ කෙළේ කෙසේ ද යන්න තේරුම් ගන්නේ නම් මේ කරුණු පැහැදිලි වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva